
මැජික් හිතේ රහස් පොත
කුඩා හිතක්... ලොකු ලෝකයක්...
ශනුති ඔගින්මා විජේතුංග

# ***මැජික් හිතේ රහස් පොත***

***කතෘ:W.M.ශනුති ඔගිත්මා විජේතුංග***

# <u>මැජික් හිතේ රහස් පොත</u>

කතෘ:ශනුති ඔගිත්මා විජේතුංග

~පළමුවන දිගහැරීම ~

II

පාසල:මහනුවර මහමායා බාලිකා විදුහල.

පන්තිය:6-A

පළ කරන දිනය:2026-05-10



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# පිදුම

මෙම පොත රචනා කිරීමට මා හට
අවස්ථාව ලබා දුන් ආදරණීය
ගුරු මණ්ඩලයත් අප විද්‍යාලයේහි
ගරු විදුහල්පතිතුමියටත් මේ පොත
පිළිගන්වමි.

එමෙන්ම මෙයට සහය දැක්වූ
මාගේ ආදරණීය පොමාපියන් හට
මෙය සාදරයෙන් පිළිගන්වමි.

පොත කියන පාඨක ඔබ සැමට
සාදරයෙන් පිළිගන්වමි.

# පටුන


1. පීටර් සහ මැජික් පොත ..................... 01
2. මැජික් පොතේ පළමු අභියෝගය .......... 09
3. පළමු අභියෝගයට සලකුණු කිහිපයක් .... 17
4. පළමු අභියෝගයේ ජයග්‍රහණය ............ 23
5. කාලය අතරීන් ගිය පීටර් ..................... 31
6. අලුත් ඉස්කෝලේ පළමු දවස ............... 39
7. කතා කරන ගස සහ
නව නිපැයුමේ ජයග්‍රහණය .................. 49
8. අලුත් ඉස්කෝලේ තවත් දවසක් ........... 59
9. නැතිවූ මැජික් පොත ......................... 67
10. සිහින හා යථාර්ථය ......................... 75
11. නව ජයක් ........................ 83

# 1.පීටර් සහ මැජික් පොත.

එංගලන්තයේ තිබෙන බිබරි කියන ඉතා සොඳුරු ගමක පීටර් කියලා පුංචි කොලු පැටවෙක් සිටියේ ය. පීටර් හරිම කුතුහලයෙන් පිරුණු දරුවෙකි. ඔහු හැම දේ ගැන ම ඇයි? කොහොමද ? කියලා සිතීම වැඩියෙන් ම කළේ ය.

එක දවසක් පීටර්ගේ අම්මා වන 'එමිලි' නිවසේ පරණ කාමරයක් පිරිසිදු කරන අතර දී පෙට්ටගමක තිබූ මැජික් පොතක් හමු විය . එමිලි එය පීටර්ට දුන්නා ය. එමිලි "පුතේ, මේක මැජික් පොතක්" කියලා කීවා ය .පීටර් මේක පරීක්ෂා කරලා බැලුවේ ය."ඔව් අම්මේ , මේක මැජික් පොතක් " ඔහු කිව්වේ ය.

මේක ඔයාලා හිතන තරම් මැජික් පොතක් නොවේ.ප්‍රශ්නය කිව්වහම හරිම පිලිතුර හමුවෙනවා.පීටර්ට හරියන ම පොත තමයි හමුවුණේ.

ඉතින් ඔහු මුලු දවසෙම ප්‍රශ්න ලියලා උත්තර ලබා ගත්තේ ය.ඔහුට දැන් දැනෙන්නේ පොත තමන්ගේ ම යාලුවෙක් වගෙයි."ඊළඟට මට මොනවාද කරන්න තියෙන්නේ?"පීටර් පොතෙන් ඇසුවේ ය. "ඊළඟට ඔයාට තියෙන්නේ සොබාදහමේ රහසක් සෙවීමට" පොත පැවසුවේ ය.

පීටර්ගේ හිත කුතුහලයෙන් පිරුණේ ය .



# *2.රහස් පොතේ පළමු අභියෝගය*

වෙනදා මෙන්ම පීටර් උදෙන්ම අවදි වුණේ ය.මැජික් පොත අතට ගත්තේ ය.පීටර් පොතෙන් " මගේ පළමු අභියෝගය කුමක්ද?"කියා ඇසුවේ ය.පොත පීටර්ට"ඔයාගේ පළවෙනි අභියෝගය තමයි සොබාදමේ රහසක් සෙවීම"පැවසුවේ ය.

සොබාදමේ රහස සෙවීමට පීටර් වනය දෙසට ගියේ ය.යන අතරතුරදි ගසක් පාමුල ටිකක් අසාමාන්‍ය දෙයක් දැක්කේ ය.විවිධ සලකුණු එම ගසෙහි තිබුණේ ය.ඔහුට හරිම පුදුම යි. මේවා ඉන් මොනවාද වෙන්නේ කියලා දැනගන්න.පීටර්ගේ හිත කුතුහලයෙන් පිරි තිබුණි.

# 3.පළමු අභියෝගයට සලකුණු කිහිපයක්

පීටර් ගස මුල තිබෙන සලකුණු දෙස බලා සිටියේ ය.ඔහු ඝන අඳුරට බියයි.නමුත් ඔහු සලකුණු පස්සෙන් ඇවිද ගියේ ය.

අන්තමේ දී ඔහුට පරණ ගලින් සෑදූ ගල් දොරක් හමුවිය.එම දොර මතත් ගස පාමුල තිබූ සලකුණු ම තිබුණි.ඔහු  ගල්දොර සෙමින් ඇරලා ඇතුලට ගියේ  ය.එහි  පරණ පොත් සහ සිතියම් තිබුණි.ඔහු පුදුමයට පත් වුණේ ය.පීටර් මේවා දිහා බල බලා සිටියේ දී ම රෑ බෝ වුණි.පීටර් අඳුරට බිය නිසා ගෙදරට ගියේ ය.ඔහු රෑ නින්දට ගියේ හෙට දින වනයට ගොස් සොබාදහමේ රහස අනිවාර්යෙන්ම සොයාගන්නවා කියන කල්පනාවෙනි.



# 4.පළමු අභියෝගයෙහි ජයග්‍රහණය

පීටර් උදෙන්ම අවදි වී වනය දෙසට ගියේ ය.සිතියමේ උදව්වෙන් ඔහු සොබාදමේ රහස තියෙන තැනට යන්නට පටන් ගත්තේ ය.අන්තිමේදී ඔහු සොබා දහමේ රහස තිබෙන තැනට ගියේ ය.එයා මැජික් පොතට කිව්වා"යාළුවේ මම පළමු අභියෝගය ජය ගත්තා කියලා.පොතටත් හරිම සතුටුයි.පොත කිව්වා"මං දන්නවා ඔයා අභියෝග බාරගන්න හොඳ ළමයෙක් කියලා.

මට හරිම සතුටුයි පළමු අභියෝගය ජයග්‍රහණය කළ නිසා".පීටර් ටිකක් දුර ඇවිත් තියෙන නිසා වේලාසනින්ම රෑ බෝ වෙන්න කලින් ගෙදර

යන්නට පටන් ගත්තේ ය.ඔහු ගෙදර ගොස් අම්මාටත් සොබාදමේ රහස සොයාගත් බව පැවසුවේ ය.

.

එමිලිත් සතුටු වූවා ය.ඔහුට උත්සාහ කළොත් වරදින්නේ නැති බව ත් තේරුණේ ය. ඔහු රෑ නින්දට ගියේ තවත් හීන ගොඩක් තියා ගනිමිනි.

# 5.කාලය අතරින් ගිය පීටර්

මැජික් පොත හමුවෙලා අදට වසරක් වෙනවා.මැජික් පොත හමුවුණේ පීටර්ගේ උපන්දිනය දවසේ.ඉතින් පීටර්ට දැන් අවුරුදු දහයක් වෙනවා.ඔහු දැන් පාසලුත් යනවා.එහෙත් ඔහු මැජික් පොත නම් අමතක කළේ නැත.

දැන් ඔහුට යාළුවොත් ඉන්නවා. යාළුවොත් සමඟ ඔහු හැමදාම සෙල්ලම් කළේ ය.හොඳට ඉගෙන ගන්න වැඩත් කළේ ය.



# 6.අලුත් ඉස්කෝලේ පළමු දවස


පීටර් උදෙන්ම අවදි වුණේ ය.අම්මා සමඟ පාසල වෙත ගියේ ය.අලුත් යාලුවොත් සමග ඔහු කතා කළේ ය.පාසල ආරම්භ විය.ගුරුතුමිය ඔවුන් ඇමතූවා ය.

"හෙට පැමිණෙන විට සැවොම නව නිපැයුමක් හදන්න තොරතුරු සොයා ගෙන  එන්න ඕන".ගුරුතුමිය පැවසුවා ය.මෙය සොබාදහමත් සමඟ එකතු වන  නව නිපැයුමක්.පීටර් නම් මේ වැඩේට දක්ෂයි.මොකද එයා කලින් මේ වගේ දේවල් මැජික් පොතත් සමග කරලා තියෙන නිසා.

පීටර් පාසල අවසන් වූ පසු ගෙදරට ගොස් වනය දෙසට ගියේ ය.යන අතරතුරේදී පීටර්ට කතා

කරන ගසක් හමු විය.පීටර් පුදුම වුණේ ය.පීටර්ට හිතුණා මේක නව නිපැයුම සඳහා උදව් වෙයි කියලා.පීටර් ගහත් සමඟ කතා කර කර ඉද්දී නොදැනීම වේලාව ගියේ ය.

ඔහු ගෙදර ගොස් නව නිපැයුම ගැන අම්මාට පැවසුවේ ය.ඔහු හෙට පාසලට යන්න ඕන නිසා වේලාසනින් ම නිදා ගත්තේ ය.



Every leaf that falls taught me something new.
Wow! You've seen so much!

# 7.කතා කරන ගස හා නව නිපැයුමේ ජයග්‍රහණය.

පීටර් උදෑසනින් ම අවදි වී පාසල වෙත ගියේ ය.නව නිපැයුම සඳහා වනයට යෑමට ඔවුහු චාරිකාව සූදානම් කර ගත්හ.යන අතරතුරේ දී පීටර්ට කතා කරන ගහ සිහිවුණේ ය.ඔහු ටීචර්ට "ටීචර් මේ තමයි කතා කරන ගහ" පැවසුවේ ය.පළමුවෙන්ම ටීචර් පුදුම වූ අතර පසුව එය ප්‍රතික්ෂේප කළා ය.පීටර් ගහට කතා කළේ ය.ගහත් ඔහුට කතා කළේ ය.

ටීචර් ඇතුළු පන්තියේ ළමයින් පුදුම වුණේ ය.ටීචර්" පුතේ මට සමාවෙන්න ඔයාට ප්‍රතික්ෂේප කළාට'' පීටර්ට පැවසුවා ය.පීටර්"කමක් නෑ ටීචර් හැමෝටම වැරදි වෙනවනේ "පැවසුවේ ය.

පන්තියේ ළමයින් පීටර්ට අත්පොළසන් දුන්නෝ ය.





පීටර් මෙය ගෙදර ගොස් මවට ද පැවසුවේ ය.ඔහුගේ මවත් ඉතා සතුටට පත් විය.

# 8.අලුත් ඉස්කෝලේ තවත් දවසක්

පීටර් වෙන දා මෙන් උදෙන්ම අවදි වී පාසල වෙත ගියේ ය.අද පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයයි.සියලු දෙනාම එයට සහභාගි වීමට ප්‍රධාන ශාලාව වෙත ගියේ ය.

එහිදී පීටර්ටත් ත්‍යාගයක් තිබුණි.ඔහුට වසරේ හොඳම නිපැයුම්කරුවා ලෙස ත්‍යාගය ලැබුණි.ඔහු සතුටට පත් වුණේ ය.ඔහු ගෙදර ගිය විගස මේ බව අම්මාට පැවසුවේ ය.අම්මාත් සතුටු වූවා ය.ඔහුට  උත්සාහය හා විශ්වාසය වටින බව ද තමාගේ හොඳ ගතිගුණ තබා ගැනීමත් ජයග්‍රහණයට උදව් වන බව තේරුණේ ය.


BEST STUDENT
BEST
STUDENT


# 9.නැති වූ මැජික් පොත

අද සතිඅන්තයයි.පීටර් අලුත් දෙයක් කිරීමට සිතුවේ ය.ඒ සදහා මැජික් පොත සෙව්වේ ය.පොත හමු වූයේ නැත.ඔහු අම්මටත් එය සෙවීමට පැවසුවේ ය.එහෙත් එය හමුවූයේ නැත.

ඔහු දවස පුරා ම පොත සෙව්වේ ය.අන්තිමේ දී ඔහු බලන්න ඕන අන්තිම තැනත් බැලුවේ ය.එහෙත් පොත නම් හමුවුණේ නැත.පීටර් හෙට දින වනයට ගොස් පොත සෙවීමට තීරණය කළේ ය.පීටර්ගේ හිත කලබලයෙන් නිදා ගත්තේ ය.

උදෙන්ම අවදි වී ඔහු වනය වෙත ගියේ ය.වනයේත් පොත හමුවූයේ නැත.පීටර් හරිම දුකෙන් කල් ගෙව්වෙ ය.

ඔහු එදින රැයේ දී සිහිනයක් දැක්කේ ය.එහිදී පීටර්ට යලි කවදාවත් මැජික් පොත හමුවෙන්නේ නැති බවත් මැජික් පොත සම්පූර්ණයෙන් ම නිත්‍ය මායාවක් බව දක්නට ලැබුණි.


QUIET
PLEASE
A BOOK
IS A
MAGIC
DOOR
TO
KNOWLEDGE
ADVENTURES
SCIENCE
HISTORY

# 10.සිහින හා යතාර්ථය.

ඔහු උද්‍යෑසනින් ම අවදි වී එම හීනය ගැන කල්පනා කළේ ය.ඔහු එදයින් පසු මැජික් පොත පස්සෙන් ගියේ නැත. නමුත් ඔහු මැජික් නම් අමතක කළේ නැත.

ඔහු අලුත් දෑ අත් හදා බැලුවේ ය. එමෙන්ම ඔහු අම්මටත් උදව් කළේ ය.

ඔහු ගොඩක් ජයග්‍රහණ ලබා ගත්තත් ආඩම්බර වූයේ නැහැ.ඔහු හොඳින් ඉගෙන ගත්තේ ය.

කොහොම උනත් ඔහු ඔහුගේ නිර්භීතකම, කැපවීම,උත්සාහය හා උනන්දුව අත් හැරියේ නැත.

# 11.නව ජයක්.

පීටර් දැන් පීටර් දැන් ඉස්සර වගේ නෙවෙයි.ගොඩාක් වෙනස් ඔහු දැන් වයස අවුරුදු 18 ක් විතර වෙනවා.ඔහු දැන් ලෝකය ම දන්නා ප්‍රසිද්ධ විද්‍යාඥයෙක්.ඔහුගේ කුඩා කල සිට තිබූ සිහිනය සැබෑ වූ නිසා ඔහුට හරිම සතුටයි.

පීටර්ට තේරුණා ඔහුගේ උත්සාහය හා බුද්ධිමත් කම නිසා තමයි විද්‍යාඥයෙක් වෙන්න හැකි වුණේ කියලා.ඔහු දැන් හරිම කාර්යබහුලයි.ඒ වුණත් ඔහු ඔහුගේ ළමා කාලය අමතක කළේ නෑ. ඔහු වනයට යන්න අමතක කළේ නැත.

නමුත් ඔහු කාර්බහුල නිසා වනයට යන්න ටික ටික මගහැරුණා.එම නිසා වනයට සතියට එක සැරයක්වත් යන්න තීරණය කළේ ය.
සතිඅන්තයේ දී ඔහුට වනයට යන්න සිතුණේ ය.

වනයට යද්දී ඔහුට ඔහුගේ ළමා කාලය මතක් වුණේ ය. කතා කරන ගස තමයි වැඩියෙන් ම මතක් විය.දැන් වනය හරි ම සුන්දරයි.පාට පාට මල් පිපිලා සුවඳ හමයි.කුරුල්ලෝ ගීත ගයති.
ගස් පලතුරු වලින් පිරිලා තිබෙයි.යන අතරතුරේ දී පීටර්ට කතා කරන ගස හමුවුණේ ය.පීටර්ට හරිම සතුටුයි.

ගස,"පීටර් ඔයා දැන් ලොකු වෙලා" කීවේ ය.
පීටර්,"ඔව් යහළුවා.ඔයා හොඳින් ඉන්නවා ද? විමසුවේ ය.

"නැහැ යහළුවා.මිනිස්සු ටිකක් මා කපන්න යනවා."ගස කීවේ ය.


පීටර් "මම ඒ ගැන පොලිසියට දැනුවත් කරන් නම්" කීවේ ය.ඉතින් පීටර් පොලිසියට දැනුවත් කළේ ය. පොලිසිය ඒ මිනිස්සු ටික අල්ල ගත්තා. පොලිසිය" පීටර් ඔයා නම් කළේ වීර ක්‍රියාවක්. මේ මිනිස්සු මුළු කැලේ ම කපන්න ගිහින් තියෙන්නේ " පැවසී ය. පීටර්ට ගොඩක් සතුටු සිතුණේ ය. ඔහු ගසට සමු දී ගෙදර ගියේ ය.

ඔහු අම්මාටත් මේ ගැන කීවේ  ය. ඇයටත් සතුටු සිතුණා ය.ඔහුට බුද්ධිය, කරුණාව,කැපවීම හා උත්සාහය නිසා තමයි මේ සැම දේ ම  ජය

ගන්න ට හැකි යැයි  බව සිතුණේ ය. වෙන දා මෙන් සතුටින් ජීවත් වූවේ ය.

කවදාවත් මැජික් පොත අමතක කළේ නැත.ඒ වගේ ම ඔහුගේ ළමා කාලය,යහළුවන්නව

නිපැයුම් හා කතා කරන ගස අමතක කළේ නැත. ඔහු වෙන දා මෙන් සතුටින් ජීවත් වූවේ ය.


DREAM
RESEARCH
DISCOVER
INSPIRE
THE FUTURE IS MADE BY CURIOSITY
SCIENTIST AGE: 18
MOM AGE: 30
CHEMISTRY
PHYSICS
BIOLOGY
IDEAS


# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)


මැජික් යනු
අදහස්වලට ජීවය දෙන
සියුම් ආලෝකයයි.
හිතේ හැඟීම්, සිහිනයේ පැතුම්
සහ දැනුමේ ආලෝකය සමඟින්
ඔබේ ජීවිතයම මැජික් එකක් කර ගන්න.
මෙය රහඃස පෝතක් පමණක් නොව,
ඔබේ සිතේ ඇති අසීමිත හැකියාවන්
ජීවගන්වහ මග පෙන්වමවෝකි.
විශ්වාස කරන්න...
ඔබ තුළම මැජික් එකක් තිබෙනවා!